# මත් විශෝධනයට බුදු සමය ඇසුරෙන් ගොඩ නගා ගෙන ඇති ක්‍රමවේදයක්

## (පැල්මඩුල්ල මිතුරු-මිතුරෝ ආයතනය ඇසුරෙන් කෙරෙන විමර්ශනයක්)

නවීන් මධුර බණ්ඩාර[1]

මිනිසාගේ කායික හා මානසික දුබලතාවයනට ප්‍රබල ලෙස බලපෑමක් සිදු කරනු ලබන මත් ද්‍රව්‍ය හා මත්පැන් සමාජගත සංස්කෘතිකමය, ආචාර ධර්ම හා සමාජීය හර පද්ධතියට එල්ල කරනු ලබන බලපෑම අතිමහත් ය. එබැවින් මත් විශෝධනය යනු අනිවාර්යයයෙන් ම සිදු විය යුතු සමාජීය අවශ්‍යතාවයකි. ඒ සඳහා බුදු සමය ඇසුරෙන් ගොඩ නඟා ගත හැකි ප්‍රායෝගික ක්‍රමවේදයක් පිළිබඳ ව වත්මන් සමාජය ඇසුරෙන් විමසා බැලීමේදී රත්නපුර පැල්මඩුල්ල මිතුරු මිතුරෝ ආයතනයෙන් සිදු වනුයේ අනල්ප වූ සේවයක් බැව් පැහැදිලි ය. මේ පිළිබඳ ව විමර්ශනය කිරීමේදී එම ආයතනයේ ප්‍රධාන හිමියන්ගෙන් හා සේවා ලාභීන් විස්සකගෙන් ලද දත්ත උපයෝගී කරගැනේ.

මෙහිදී පුද්ගලයා ශාරීරික ව, ආධ්‍යාත්මික ව, මානසික ව හා සමාජීය ව යනුවෙන් ප්‍රධාන කරුණු පහක් යටතේ සංවර්ධනය කෙරේ. ඒවා නම් අවධාරණය (Orientation), ප්‍රාථමික ප්‍රතිකාර (Primary Treatment), නැවත ඇතුළත් වීමට පෙර (Pre- Re- Entry), නැවත ඇතුළත් වීම (Re- Entry) හා පසු විපරම (After Care) යනුවෙනි. සේවාලාභියා පූර්ණ විමර්ශනයෙන් විරමණ ලක්ෂණ හැඳින ආයතනයට හුරු කිරීම සඳහා ශාරීරික අපහසුතා මඟ හැරීම හා අසත් සමාජයෙන් වෙන් කිරීම යනාදිය අවධාරණය යටතේ සිදු කෙරේ. පුද්ගලයන්ට වගකීම් පැවරීම මඟින් වෙන් වූ පුද්ගල විරමණ ලක්ෂණ රහිත මනස ප්‍රකෘතියට පත් කොට ඩේ-ටොප් දර්ශනය, ආයතන තේමා ගීතය, ප්‍රතිකාර ප්‍රතිඥාව හා ආයතන වගකීම දයාන්විත ව සහ ප්‍රායෝගික ව හුරු කරවීම ප්‍රාථමික ප්‍රතිකාර යටතේ සිදු කෙරේ. නැවත ඇතුළත් වීමට පෙර යන්නෙන් පැරණි මිතුරන්, නිවැසියන් හා සබඳතා ගොඩනගා ගනිමින් ස්වයං අතීත ස්මරණයක් ලබා දෙමින් ප්‍රායෝගික ව පෞර්ෂත්ව හැඟීම් උද්දීපනය වන ලෙස කටයුතු වන්නට සැලැසේ. සිව් වැනි නැවත ඇතුළත් වීම යන්නෙන් පූර්ණ කැප වීම තුළින් ජ්‍යෙෂ්ඨ සොහොයුරෙකු ආශ්‍රයෙන් සේවාලාභියාට පූර්වාදර්ශයක් සමඟින් වැඩමුළු හා භාවනාව ආදියට ඉඩ සැලැස්වීම සිදු වේ. පසු විපරම යනු පසු උවටැන් සේවය ලෙස ප්‍රකට සේවාලාභියා ආයතනයෙන් බැහැරට ගිය පසු සමාජ ගත වීම දක්වා පූර්ණ විමර්ශනයක් සමඟ නැවත ආයතනය හා සම්බන්ධ වීමට ඉඩ සැලැස්වීම යි. මෙම ප්‍රතිකාර ක්‍රමය බුදු සමය හා බෙහෙවින් සමගාමී සාර්ථක ක්‍රමයක් බව පැහැදිලි ය.

**ප්‍රමුඛ පද-** මත් ද්‍රව්‍ය, විශෝධනය, පියවර, ඇතුළත් වීම, සේවා ලාභියා

1 Undergraduate - 4th year, Dept. of Pali and Buddhist Studies, University of Sri Jayewardenepura
naveenmadurasb@gmail.com